**ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය**

**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**

**නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව**

**නීතිවේදී උපාධි පාඨමාලාව - 6 වන මට්ටම**

**අවසාන පරීක්ෂණය 2020/21**

**අන්තර්ජාතික මානව හිමිකම් නීතිය LLU6717/LWU4325**

**කාලය – පැය තුනකි (03)**

---

**දිනය: 08-09-2021** **වේලාව: ප.ව 01.00 - ප.ව. 4.00**

---

**පහත දී ඇති උපදෙස් සැලකිල්ලෙන් කියවන්න.**

**ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) සමන්විතය. ඔබ ප්‍රශ්න හතරකට (04) පිළිතුරු දිය යුතුය. (අ) කොටසේ ප්‍රශ්නය <u>අනිවාර්යය ප්‍රශ්නයකි.</u> (ආ) කොටසින් ප්‍රශ්න තුනක් තෝරාගත හැක.**

**<u>(අ) කොටස</u>**

1. (අ) සෙරන්ඩිබ් යනු ආගමික කණ්ඩායම් කිහිපයකින් සමන්විත ජාතියකි. සුලුතර ආගමික කණ්ඩායමක් වන ඇල්වීනියානුවන් මරණයෙන් පසුව මෘත ශරීර භූමිදානය කල යුතු බවත්, ඒවා ආදාහනය කිරීම ආගමික විශ්වාසයන්ට පටහැණි ලෙසත් සලකයි. රට තුල සෞඛ්‍යමය වශයෙන් හදිසි තත්වයකට හේතු වූ කෝවිඩ් 19 වසංගතය පැතිරීමත් සමග සෙරන්ඩිබ් රජය වෛරසය නිසා මියයන පුද්ගලයන්ගේ සිරුරු භූමිදානය තහනම් කිරීමට තීරණය කලේය. මේ අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය දේහ භූමිදානය තහනම් කරමින් චක්‍රලේඛයක් නිකුත් කලේය. වෛරසය පිළිබඳ සියලු තොරතුරු තවමත් අනාවරණය වී නොමැති නිසා භූමිදානය කිරීම තුලින් භූගත ජල මූලාශ්‍ර දූෂණය විය හැකි බව රජය ප්‍රකාශ කලේය. ඇල්වීනියානු ප්‍රජාව නියෝජනය කරන ආගමික හා දේශපාලන කණ්ඩායම් මෙම තීරණයට විරුද්ධ වූයේ රජයේ මතය සනාථ කරන විද්‍යාත්මක සාක්ෂි කිසිවක් නොමැති බවට පවසමිනි. ලෝකයේ අන් සෑම රටකම, කෝවිඩ් 19 වෛරසය නිසා මියයන පුද්ගලයන්ගේ සිරුරු අදාල සෞඛ්‍ය නිර්දේශ අනුගමනය කරන බවට වූ නියමය මත වලදැමීමට අවසර දී තිබෙන බව ඔවුන් පෙන්වා දුන්නේය. තම ආගමික අනන්‍යතාවය මත පදනම්ව තමුන්ට අසාධාරණයක් කිරීම මෙම තීරණයේ අරමුණ බව ඔවුන් තවදුරටත් චෝදනා කලේය.

තම ඉල්ලීම්වලට රජය සුබවාදීව ප්‍රතිචාර නොදැක්වූ නිසා *ඇල්වීනියානු විමුක්ති පෙරමුණ* (ALF) නම් සංවිධානය රජයේ තීන්දුව හෙලා දැකීම සඳහා විරෝධතා උද්ඝෝෂණයක් කැඳවීය. මෙම උද්ඝෝෂණය නිසා ආගමික කෝලාහල ඇති වන බවට වූ අනුමානය මත රජය හදිසි නීති තත්වයක් ප්‍රකාශයට පත්කල අතර කවර හෝ ප්‍රසිද්ධ උද්ඝෝෂණයක් හෝ විරෝධතාවයක් පැවැත්වීම තහනම් කරමින් රෙගුලාසි නිකුත් කලේය. විරෝධතාවය දිනයේ දී පොලිසිය එම නිශ්චිත දිනයේ උද්ඝෝෂණ පැවැත්වීම අත්හිටුවන නියෝගයක් මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලබාගැනීමට ද කටයුතු කලේය. මහේස්ත්‍රාත්වරයා තම නියෝගය පදනම් කලේ හදිසි නීති රෙගුලාසිවල ප්‍රතිපාදන මතය. ALF සංවිධානය වාරණ නියෝගය නොතකා උද්ඝෝෂණය පැවැත්වීය. මෙය නවත්වන ලෙසට පොලිසිය ඉල්ලා සිටි විට, කණ්ඩායමේ නායකයා කීවේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කල මූලික අයිතිවාසිකම්වලට පටහැණි නිසා හදිසි නීති රෙගුලාසි නීති විරෝධී බවත්, එම නිසා ඒ අනුව නිකුත් කල වාරණ නියෝගය තමුන් පිළි නොගන්නා බවත්ය. පිරිස විසුරුවා හැරීමට

පොලිසිය බලය යොදාගත්තේය. රබර් උණ්ඩවලින් වෙඩි තැබීමේ දී විරෝධතාකරුවන් තිදෙනෙක් මිය ගියහ.

රජයේ ක්‍රියාකලාපය මානව අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමක් යැයි ALF සංවිධානයේ නායකයා සිතයි. මීට එරෙහිව මානව හිමිකම් කමිටුවට පැමිණිල්ලක් (communication) ඉදිරිපත් කිරීමට ඔහු අපේක්ෂා කරයි. ඔබ ALF සංවිධානයේ නීති උපදේශක බවට උපකල්පනය කරන්න. රජයේ ක්‍රියාකලාපය අභියෝගයට ලක්කල හැකි පදනම් කවරේදැයි පැහැදිලි කරන පත්‍රිකාවක් සකස් කරන ලෙස සංවිධානයේ නායකයා ඔබගෙන් ඉල්ලා සිටියි. අන්තර්ජාතික මානව හිමිකම් නීතියේ අදාල ප්‍රතිපාදන වෙත අවධානය යොමුකරමින් මෙම පත්‍රිකාව සකස් කරන්න. රජය විසින් ඉදිරිපත් කරනු ලැබිය හැකි ප්‍රති-තර්ක ද ඔබ සාකච්ඡා කල යුතුය. සෙරන්ඩිබ් රාජ්‍යය සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිලිබඳ අන්තර්ජාතික සම්මුතිය (ICCPR) සහ එහි පලමු වෛකල්පිත සන්ධානය අපරානුමත කොට ඇති බවට උපකල්පනය කරන්න.

(ලකුණු 25)

(b) මියගිය විරෝධතාකරුවෙක්ගේ පියා වන එස්කොබාර් මහතා පුද්ගලික මට්ටමින් මානව හිමිකම් කමිටුවට පැමිණිල්ලක් ගොනු කිරීමේ අදහසින් ඔබව අමතයි. දේශීය වශයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට ඔහු මැලි වන්නේ, දේශීය අධිකරණය තම ආගමික ප්‍රජාවට එරෙහි පක්ෂග්‍රාහී ආකල්පයන්ගෙන් යුක්ත බවට ඔහු සිතන නිසාය. තවද, තමුන්ට පලිගැනීම්වලට මුහුණ දීමට සිදුවනු ඇති බවට වූ බිය නිසා පැමිණිල්ල නිර්නාමිකව ඉදිරිපත් කිරීමට ඔහු අදහස් කරයි. මානව හිමිකම් කමිටුව තම අයිතිවාසිකම් කඩ වී තිබෙන බවට තීන්දු කලහොත් තමාට සහන සැලසීමට සෙරන්ඩිබ් රජය බැඳී සිටීදැයි දැනගැනීමට ඔහුට උවමනා කොට තිබේ. මානව හිමිකම් සම්මුතීන් හි අදාල ප්‍රතිපාදන හා නඩු තීන්දු නීතිය අනුසාරයෙන් එස්කොබාර්ට උපදෙස් දෙන්න. සෙරන්ඩිබ්හි නීති පද්ධතිය ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට සමාන බව උපකල්පනය කරන්න. (ලකුණු 15)

[මුළු ලකුණු : 25+15= 40]

**<u>(ආ) කොටස</u>**

2. *ධරණී* යනු සෙලන්කා රාජ්‍යය තුල ක්‍රියාත්මක, ගම්බද ජනතාව සවිබල ගැන්වීම සඳහා කටයුතු කරන ප්‍රජා-මූල සිවිල් සමාජ සංවිධානයකි. සෙලන්කා යනු දුර්වල ආර්ථිකයක් තිබෙන සංවර්ධනය වෙමින් තිබෙන රටකි. සෙලන්කා හි මෑතකාලීනව මතු වී තිබෙන එක් සෞඛ්‍ය ප්‍රශ්නයක් වන්නේ ගම්බද වාසීන් ගණනාවක ජීවිත තර්ජනයට ලක්කරමින් පැතිර යන එක්තරා වකුගඩු රෝගයකි. මෙම රෝගය පැතිර යාම පසුපස කෘෂිකාර්මික කටයුතු සඳහා රසායනික පොහොර අධිභාවිතය හේතු වී තිබෙන බවට විද්‍යාත්මක දත්ත ඉදිරිපත් වී තිබේ. මෙම රෝගය නිසා ගම්බද ජනතාවට මුහුණ දීමට සිදුව තිබෙන සෞඛ්‍ය ප්‍රශ්න පිලිබඳ *ධරණී* සංවිධානය සැලකිලිමත්ය. හානිකර රසායනික සංයුතියෙන් යුක්ත පොහොර භාවිතය නියාමනය කරන ලෙසට ඔවුන් රජයෙන් දිගටම ඉල්ලා සිට තිබේ. මෙම ඉල්ලීම් නොතකා හල රජය දිගටම හානිකර සංයුතියෙන් යුක්ත පොහොර ආනයනයෙහි නියුක්ත වේ. ගම්බද ප්‍රදේශවල තිබෙන බරපතල සෞඛ්‍ය පහසුකම් හිඟය ගැන ද *ධරණී* සංවිධානය සැලකිලිමත්ය. වකුගඩු රෝගයට ගොදුරු වන රෝගීන්ට විශේෂිත ප්‍රතිකාර අවශ්‍ය කෙරේ. ගම්බද රෝහල්වලට මෙම පහසුකම් සැපයීමට රජය නිසි පියවර ගෙන නැති බවට *ධරණී* සංවිධානය චෝදනා කරයි. ඔවුන් තවදුරටත් කියා සිටින්නේ, පසුගිය වසර කිහිපය තුල රජය අයවැයෙන් සෞඛ්‍යය සේවාවට වෙන් කරන වියදම සීඝ්‍රයෙන් පහත වැටී ඇති බවය. මෙම චෝදනාවලට ප්‍රතිචාර දක්වමින් සෞඛ්‍ය ඇමතිවරයා පවසන්නේ සෙලන්කා දුගී රටක් බවත්,

විශේෂිත ප්‍රතිකාර සඳහා විධිවිධාන සැලසීමට තරම් ප්‍රමාණවත් සම්පත් තමුන් සතුව නොමැති බවත්ය. දුගී රටක් ලෙස සෙලන්කා හි ප්‍රමුඛතාවය සංවර්ධනය බවත්, එම නිසා අයවැයෙන් මුදල් වෙන් කිරීමේ දී සංවර්ධනය ඉලක්ක කරගත් මාර්ග සංවර්ධනය බඳු කටයුතු සඳහා තමුන්ට ප්‍රමුඛතාවය ලබාදීමට සිදුවන බවත් ඇමතිවරයා තවදුරටත් කියයි.

(අ) අන්තර්ජාතික මානව හිමිකම් නීතියේ සන්දර්භය තුල, අත්පත් කරගත හැකි උපරිම ප්‍රමිතියේ සෞඛ්‍ය පහසුකම් සඳහා වූ අයිතිය (highest attainable standard of health) සම්බන්ධයෙන් සෙලන්කා රජයේ නීතිමය බැඳීම් සාකච්ඡා කරන්න. අන්තර්ජාතික මානව හිමිකම් සම්මුතීන්වල අදාල ප්‍රතිපාදන මෙන්ම සම්මුති යාන්ත්‍රණයන් විසින් නිකුත් කොට තිබෙන පොදු පරිකථනයන් (General Comments) හා සම්ප්‍රේක්ෂණයන් (views) ද ඔබගේ සාකච්ඡාවේ දී සැලකිල්ලට ගන්න.

(ලකුණු 12)

(ආ) සෙලන්කා හි නීති පද්ධතිය ශ්‍රී ලංකාවට සමාන බව උපකල්පනය කරන්න. ගම්බද ජනතාවගේ සෞඛ්‍යය සඳහා වූ අයිතිවාසිකම උල්ලංඝණය වීම සම්බන්ධයේ මූලික අයිතිවාසිකකම් නඩුකරයක් ගොනු කිරීමේ හැකියාව *ධරණී* වෙත පවතීද? සෞඛ්‍යය සඳහා වූ අයිතිවාසිකම බඳු අයිතීන් මූලික අයිතිවාසිකම් නඩු ක්ෂේත්‍රයට ගෙන ඒම සඳහා යොදාගත හැකි නෛතික උපායමාර්ගයක් ඔබට යෝජනා කල හැකිද? (ලකුණු 08)

[මුලු ලකුණු: 12+ 8 = 20]

3. *'…රාජ්‍යයන් කොමිසමේ සාමාජිකත්වය ලබාගැන්මෙන් අපේක්ෂා කරන්නේ මානව හිමිකම් ආරක්ෂා කිරීමට වඩා අනෙක් අයගේ විවේචනයන්ගෙන් ආරක්ෂා වීම හා අනෙත් අය විවේචනය කිරීමට අවස්ථාවක් පාදා ගැනීමය. මෙහි ප්‍රතිඵල ලෙස, සැලකිය යුතු තරමේ හිස්තැනක් නිර්මාණය වී තිබෙන අතර මෙය එක්සත් ජාතීන්ගේ සංවිධාන රාමුවේ කීර්ති නාමය අඳුරු කරන සෙවණැල්ලක් බවට පත් වී තිබේ'*

- කොෆී අනන් (එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හිටපු මහ ලේකම් , 2005)

2006 දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය ස්ථාපිත කලේ, ඊට පෙර තිබූ මානව හිමිකම් කොමිසම මානව හිමිකම් සුපරීක්ෂණ යාන්ත්‍රණයක් ලෙස ප්‍රමාණවත් නොවූ බවට වූ පදනම මතය. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය මානව හිමිකම් ආරක්ෂාව හා ප්‍රවර්ධනය සඳහා කටයුතු කරන ආකාරය පැහැදිලි කරන්න. මානව හිමිකම් ආරක්ෂාව සඳහා වූ අන්තර්ජාතික පර්යාය වෙත එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය දක්වන දායකත්වය විවේචනාත්මකව විමසන්න.

[ලකුණු 20]

4. සෝමාන් යනු ගතානුගතික සංස්කෘතික ලක්ෂණ බහුල දූපත් රාජ්‍යයකි. සාම්ප්‍රදායිකව සොමාන් හි උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය පිරිමි සිසුන්ට සීමා වී පැවැතිණ. 1990 ගණන් වන තුරු, කාන්තාවන් විශ්ව විද්‍යාලවලට ඇතුලත් වීම තහනම් කරන නීතියක් පවා බලාත්මක විය. දෛනික වැඩකටයුතු සඳහා අවශ්‍ය මට්ටමින් ඔබ්බට කාන්තාවන් අධ්‍යාපනය ලැබීමේ අවශ්‍යතාවයක් නැති බවට සමාජයේ වූ බලගතු ගතානුගතික ආකල්පය මෙම නීතිය තුලින් පිලිබිඹු විය. කාන්තාවන්

වෘත්තිකයන් වීම අනුචිත යමක් ලෙස සැලකුණු අතර දරුවන් හදාවඩා ගැනීම හා හොඳ ගෘහණියක් වීම කාන්තාවකගේ භූමිකාව ලෙස සැලකුණි. කෙසේ වුවද, 1990 ගණන්වල දී අලුත බලයට පත්වූ ආණ්ඩුවක් - කාන්තා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමේ අදහස සහිතව - කාන්තා සිසුවියන්ට විශ්ව විද්‍යාල ප්‍රවේශයට අවසරය ලබා දීමට තීන්දු කලේය. පැරණි නීතිය අවලංගු කල රජය කාන්තාවන්ට විශ්ව විද්‍යාල ප්‍රවේශය සහතික කලේය. මෙම තීරණය පැවතිය ද විශ්ව විද්‍යාලවලට ඇතුලු වන කාන්තාවන්ගේ ප්‍රමාණයේ සැලකිය යුතු වර්ධනයක් සිදු වූයේ නැත. 2020 වර්ෂයේ දී කල සමීක්ෂණයක දී හෙලි වූයේ විශ්ව විද්‍යාල ප්‍රවේශය ලබන මුලු සිසුන් අතුරින් කාන්තාවන් වූයේ සියයට 10 ක් පමණක් බවය. මෙම සිසුවියන් අතුරින් බහුතරය නාගරික මධ්‍යම පන්තික පවුල් පසුබිම්වලින් ආ අය වූහ. ගම්බද ප්‍රදේශවලින් පැමිණෙන කාන්තා සිසුවියන් ප්‍රමාණය ඉතාම සුලු ප්‍රමාණයක් බව සමීක්ෂණයේ දී හෙලි විය. ගම්බද ප්‍රදේශවල ගතානුගතික සංස්කෘතික ආකල්ප ප්‍රබලව පවතින අතර මෙම ආකල්පවලට අනුව උසස් අධ්‍යාපනය ලැබීම කාන්තාවන්ට නුසුදුසුය. උසස් අධ්‍යාපනයේ කාන්තා සහභාගීත්වය වර්ධනය කිරීමට තමුන්ට කල හැකි උපරිමය සිදුකොට තිබෙන බව ආණ්ඩුව කියයි. කලින් පැවති තහනම ඉවත් කිරීම සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීමට තමුන් ගත් උත්සාහය සඳහා උදාහරණයක් ලෙස රජය දක්වයි.

ඔබ කාන්තාවන් සඳහා සමාන අයිතිවාසිකම් වෙනුවෙන් කටයුතු කරන මානව හිමිකම් ක්‍රියාධරයෙක් බව උපකල්පනය කරන්න. සෝමාන් දේශය කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස් කොට සැලකීම් මුලුනුපුටා දැමීමේ සම්මුතිය (CEDAW) අපරානුමත කොට තිබෙන බව ද සලකන්න. මෙම සම්මුතියේ සන්දර්භය තුල, සෝමාන් දේශය උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුල කාන්තාවන්ට සමාන අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමෙහිලා මොන තරම් දුරට පියවර ගෙන තිබේදැයි විභාග කරන්න. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුල කාන්තා අයිතිවාසිකම්වල තත්වය නැංවීම සඳහා ඔබ ඉදිරිපත් කරන යෝජනා මොනවාද? [ලකුණු 20]

5. (අ) අන්තර්ජාතික අපරාධ අධිකරණය (ICC) පිහිටුවීම අන්තර්ජාතික අපරාධ සඳහා වගවීම සහතික කිරීම සම්බන්ධයෙන් වූ ගමන් මගෙහි සන්ධිස්ථානයකි. කෙසේ වුවද, අන්තර්ජාතික අපරාධවලට නඩු පැවරීම සම්බන්ධයෙන් ඓතිහාසික පූර්ව නිදර්ශන පවතී. 1990 ගණන්වල දී එක්සත් ජාතීන්ගේ සංවිධානය ස්ථාපිත කල *තත්කාර්ය විනිශ්වය සභා* (*ad hoc* tribunals) වන පැරණි යුගොස්ලෝවියාව සඳහා වූ අන්තර්ජාතික අපරාධ විනිශ්වය සභාව (ICTY) හා රුවන්ඩාව සඳහා වූ අන්තර්ජාතික අපරාධ විනිශ්වය සභාව (ICTR) නීතියේ මෙම අංශයෙහි වර්ධනය සම්බන්ධයෙන් වැදගත් සංසිද්ධීන්ය. අන්තර්ජාතික අපරාධ අධිකරණය හා එක්සත් ජාතීන්ගේ තත්කාර්ය විනිශ්වය සභා අතර වෙනස කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්, අන්තර්ජාතික අපරාධ අධිකරණයේ බලතල හා කාර්යයන් සාකච්ඡා කරන්න. (ලකුණු 12)

(ආ) *'රෝම සම්මුතිය (2002) අපරානුමත නොකල රටක බලධාරීන්ගේ ක්‍රියාකලාපය අන්තර්ජාතික අපරාධ අධිකරණය වෙත යොමු කල නොහැක. එවැනි බලධාරීන්ගේ චර්යාව අන්තර්ජාතික අපරාධ අධිකරණ පාත්‍රතාවයෙන් සම්පූර්ණයෙන් විනිර්මුක්තය'.*

මෙම ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේද? රෝම සම්මුතියේ ප්‍රතිපාදන කෙරෙහි අවධානය යොමු කරමින් ඔබගේ පිලිතුර පැහැදිලි කරන්න. (ලකුණු 08)

[මුලු ලකුණු:12 + 8 = 20]

***